සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved]

විශාඛා විද්‍යාලය කොළඹ - 5, විශාඛා විද්‍යාලය කොළඹ - 5, විශාඛා විද්‍යාලය කොළඹ - 5, විශාඛා විද්‍යාලය කොළඹ
Visakha Vidyalaya Colombo – 5, Visakha Vidyalaya Colombo – 5, Visakha Vidyalaya Colombo –
විශාඛා විද්‍යාලය කොළඹ - 5, විශාඛා විද්‍යාලය කොළඹ - 5, විශාඛා විද්‍යාලය කොළඹ - 5, විශාඛා විද්‍යාලය කොළඹ
Visakha Vidyalaya Colombo – 5, Visakha Vidyalaya Colombo – 5, Visakha Vidyalaya Colombo –

විශාඛා විද්‍යාලය - කොළඹ 05
Visakha Vidyalaya, Colombo 05

දෙවන වාර පරීක්ෂණය 2023 (2023 ඔක්තෝම්බර්)
Second Term Test 2023 (October 2023)

ගණිතය I Mathematics I	10 ශ්‍රේණිය Grade 10	පැය දෙකයි *Two hours*

නම / අංකය : ....

නිවැරදි බවට සහතික කරමි.

....

ශාලා නිරීක්ෂකගේ අත්සන

වැදගත් :

* මෙම ප්‍රශ්න පත්‍රය පිටු **8** කින් සමන්විත ය.
* **මෙම පිටුවේත්, තුන්වැනි පිටුවේත්** නියමිත ස්ථානවල ඔබේ **විභාග අංකය** නිවැරදිව ලියන්න.
* ප්‍රශ්න **සියල්ලටම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ** ම සපයන්න.
* පිළිතුර ලිවීමටත් එම පිළිතුර ලබා ගත් ආකාරය දැක්වීමටත් එක් එක් ප්‍රශ්නය යටින් තබා ඇති ඉඩ ප්‍රමාණය ප්‍රයෝජනයට ගන්න.
* ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී අදාළ පියවර හා **නිවැරදි ඒකක** දක්වන්න.
* පහත දක්වා ඇති පරිදි ලකුණු ප්‍රදානය කෙරේ.
  A කොටසෙහි
  එක් එක් ප්‍රශ්නයට ලකුණු 2 බැගින්.
  B කොටසෙහි
  එක් එක් ප්‍රශ්නයට ලකුණු 10 බැගින්.
* කටුවැඩ සඳහා හිස් කඩදාසි ලබාගත හැකි ය.

පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි.

කොටස	ප්‍රශ්න අංක	ලකුණු
A	1 - 25	
B	1	
	2	
	3	
	4	
	5	
එකතුව		

.... පළමුවන පරීක්ෂක	.... සංකේත අංකය
.... දෙවන පරීක්ෂක	.... සංකේත අංකය
.... ගණිත පරීක්ෂක	.... සංකේත අංකය
.... ප්‍රධාන පරීක්ෂක	.... සංකේත අංකය

[දෙවැනි පිටුව බලන්න

A කොටස

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.

1. රුපියල් 50,000 ක් ණයට ගත් පුද්ගලයෙකුට වාර්ෂික සුළු පොළී අනුපාතය 15% ක් යටතේ අවුරුදු දෙකක් අවසානයේ ගෙවීමට සිදුවන මුළු පොළිය ගණනය කරන්න.

2. $\frac{3}{5x} - \frac{1}{10x}$ සුළු කරන්න.

3. $\log_2 256 = 8$ දර්ශක ආකාරයෙන් දක්වන්න.

4. $24ab^2, 9a^2bc^2$ මෙම වීජීය පදවල කුඩාම පොදු ගුණාකාරය සොයන්න.

5. $(2x - 1)(x + 5) = 0$ සමීකරණයේ විසඳුම් සොයන්න.

6. රූපයේ දී ඇති දත්ත ඇසුරෙන් a හා b සොයන්න.



7. වෙන් රූප සටහන මත $A^{/} \cap B$ ප්‍රදේශය අඳුරු කරන්න.



8. පසුම්බියක එකම තරමේ සුදුපාට පබළු 3 ක් ද, රතුපාට පබළු 2 ක් ද, නිල්පාට පබළු එකක් ද ඇත. අහඹු ලෙස එක් පබළුවක් ඉවතට ගන්නේ නම්, එම පබළුව රතු පබළුවක් නොවීමේ සම්භාවිතාව සොයන්න.

9. දී ඇති තොරතුරු ඇසුරෙන් සරල රේඛාවේ සමීකරණය ලියන්න.



10. අරය r වූ අර්ධ වෘත්තයක වර්ගඵලය 18π වේ. එහි අරය සොයන්න.

11. $x^2 - 2x - 8$ සාධක සොයන්න

12. $3 - \frac{x}{5} = 2$ විසඳන්න.

13. $ABC\,\Delta$ හා $BED\,\Delta$ අංගසම වේ. අංගසම අවස්ථාව සඳහන් කර DE පාදයට සමාන පාදයක් ලියන්න.



14. $72\,\text{km}\,\text{h}^{-1}$ ක වේගයෙන් ගමන් ගන්නා දුම්රියක් තත්පර 12 ක් තුළ දී ගමන් කරන දුර මීටර්වලින් සොයන්න.

15. $10^{1.4082} = 25.6$ නම්
lg 2.56 සොයන්න.

16. රූපයේ දී ඇති දත්ත ඇසුරින් x හි අගය සොයන්න.



17. යම් කාර්යයක් කිරීමට මිනිසුන් අට දෙනෙකුට දින 7 ක් ගත වේ. එම කාර්යය ආරම්භ කර දින දෙකකට පසු තවත් මිනිසුන් දෙදෙනෙක් එක් වූයේ නම් ඉතිරි කාර්යය නිම කිරීමට ගතවන දින ගණන සොයන්න.

18. $ABCD$ සමාන්තරාස්‍රයේ x හි අගය සොයන්න.



9. $x^2 + y^2 = 41, xy = 20$ ද නම්, $x + y$ හි අගය සොයන්න.

20. සත්‍ය ප්‍රකාශ ඉදිරියෙන් '√' ලකුණ ද අසත්‍ය ප්‍රකාශ ඉදිරියෙන් '×' ලකුණ ද යොදන්න.

(i) ඍජුකෝණාස්‍රයක විකර්ණ මගින් ශීර්ෂ කෝණ සමච්ඡේදනය වේ. ☐

(ii) රොම්බසයක විකර්ණ ලම්භව සමච්ඡේදනය වේ. ☐

(iii) ඕනෑම සමාන්තරාස්‍රයක විකර්ණ දිගින් සමාන වේ. ☐

21. $ABCD$ සෘජුකෝණාස්‍රයක් වේ. දී ඇති දත්ත ඇසුරෙන් x හා y සොයන්න.



22. රගර් ක්‍රීඩාවට කැමති ක්‍රීඩකයින් ගණන 15 ක් නම් ක්‍රිකට් ක්‍රීඩාවට කැමති ක්‍රීඩකයින් ගණන සොයන්න.



23. $(x - 7)\,(2x + 3)$ සුළු කරන්න.

24. $\sqrt{53}$ හි පළමු සන්නිකර්ෂණයට සොයන්න.

25. A හා B ලක්ෂ්‍යවලට සමදුරින් ද, AB හා BC රේඛාවලට සමදුරින් ද පිහිටියා වූ P ලක්ෂ්‍යය, පථ පිළිබඳ දැනුම භාවිතයෙන් සොයන්න.



* *

B කොටස

* ප්‍රශ්න **සියල්ලට ම** මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

1. පාසල් විවිධ ප්‍රසංගයක දී එම පාසලේ සිසුන් $\frac{2}{5}$ ක් ගායනාවලට ද $\frac{1}{3}$ ක් නැටුම්වලට ද සහභාගී වූ අතර ඉතිරි සිසුන්ගෙන් $\frac{1}{4}$ ක් නාට්‍යවලට සහභාගී වූහ. මෙම සෑම සිසුවෙකුම සහභාගී වූයේ විවිධ ප්‍රසංගයේ එක් අංගයකට පමණි.

(i) ගායනා හෝ නැටුම් සඳහා සහභාගී වූ ශිෂ්‍ය සංඛ්‍යාව, පාසලේ මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් කුමන භාගයක් ද?

(ii) පාසලේ මුළු සිසුන්ගෙන් කොපමණ භාගයක් නාට්‍ය සඳහා සහභාගී වූවෝ ද?

(iii) විවිධ ප්‍රසංගයේ ඉහත අංග තුනෙන් එකකටවත් සහභාගී නොවූ ශිෂ්‍ය සංඛ්‍යාව මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් කවර භාගයක් ද?

(iv) විවිධ ප්‍රසංගයේ ඉහත අංග තුනෙන් එකකටවත් සහභාගී නොවූ ශිෂ්‍ය සංඛ්‍යාව 12 දෙනෙකු නම් නැටුම්වලට සහභාගී වූ ශිෂ්‍ය සංඛ්‍යාව කීය ද?

2. 10 ශ්‍රේණියේ සිටින සිසුන් තුන්වන කාණ්ඩ සඳහා හදාරන විෂයයන් පිළිබඳ තොරතුරු පහත වට ප්‍රස්තාරයේ දැක්වේ.



(i) කෘෂි විද්‍යාව හදාරන සිසුන් ගණන 18 ක් නම්, පන්තියේ සිටින මුළු සිසුන් ගණන සොයන්න.

(ii) ගෘහ විද්‍යා විෂයය හදාරන සිසුන් ගණන සොයන්න.

(iii) සෞඛ්‍ය විෂයය හදාරන සිසුන් ගණන තොරතුරු තාක්ෂණ විෂයය හදාරන සිසුන්ගෙන් හරි අඩක් නම්, තොරතුරු තාක්ෂණය හා සෞඛ්‍යය විෂයය නිරූපණය කරන කේන්ද්‍රික ඛණ්ඩවල කෝණත්, එම විෂයය හදාරන සිසුන් ගණනත් වෙන වෙනම සොයන්න.

(iv) පසුව තොරතුරු තාක්ෂණය විෂයය හදාරන සිසුන් 9 දෙනෙකු ඉන් ඉවත් වී ගෘහ විද්‍යාව විෂයය හැදෑරීමට ආරම්භ කරන ලදී. වෙනස් වූ දත්ත සලකා ගෘහ විද්‍යාව නිරූපණය වන කේන්ද්‍රික ඛණ්ඩයේ කේන්ද්‍රික කෝණය සොයන්න.

3. රූප සටහනේ $PQRS$ මගින් දැක්වෙන්නේ ඉඩමක කොටසකි. එහි කේන්ද්‍ර කෝණය $90°$ ක් වූ PST කේන්ද්‍රික ඛණ්ඩ කොටසේ එළවළු වගා කර ඇත. මෙහි $SR = 25\,\text{m}$, $QT = 14\,\text{m}$ ද $PT = 7\,\text{m}$ ද වේ. ($\pi = \frac{22}{7}$ ලෙස යොදාගන්න)



(i) එළවළු වගා කර ඇති කොටසේ පරිමිතිය සොයන්න.

(ii) එළවළු වගා කළ කොටසේ වර්ගඵලය සොයන්න.

(iii) එළවළු සඳහා වෙන් කළ කොටස හැර ඉඩමේ ඉතිරි කොටසේ වර්ගඵලය සොයන්න.

(iv) මෙම ඉඩම ඇතුළත එළවළු වගා කළ කොටසේ වර්ගඵලය මෙන් දෙගුණයක වර්ගඵලයට සමාන සෘජුකෝණාස්‍රාකාර මල් පාත්තියක් QT මායිමක් වන සේ තැනිය යුතු නම් මල් පාත්තියේ දළ සටහනක් මිනුම් සහිතව ඉහත රූපය තුළම ඇඳ දක්වන්න.

4.(*a*) සමන් යතුරු පැදියකින් නගරයට යාම පිළිබඳව අඳින ලද දුර කාල ප්‍රස්තාරය පහත පරිදි වේ.



(i) ගමනේ QR කොටසේ වේගය සොයන්න.

(ii) QR කොටසේ වේගයෙන් මුළු ගමනම ගියේ නම් ඔහුට ගමනට ගතවන මුළු කාලය සොයන්න.

(iii) ගමනේ මධ්‍යක වේගය සොයන්න.

(*b*) මෝටර් රථයක් A නම් නගරයක සිට $40\,\text{km h}^{-1}$ ක වේගයෙන් ද තවත් මෝටර් රථයක් B නම් නගරයක සිට $60\,\text{km h}^{-1}$ ක වේගයෙන් දෙදෙනා මුණ ගැසීමේ අරමුණින් එකම වේලාවක දී ගමන ආරම්භ කරයි. A හා B නගර දෙක අතර දුර $180\,\text{km}$ ක් නම් පැය $1\frac{1}{2}$ කට පසුව මෝටර් රථ දෙක අතර දුර සොයන්න.

5. සේවකයින් 20 දෙනෙක් දින 15 ක දී ඇලකින් $\frac{1}{3}$ ක් කපා නිම කරන ලදී.

(i) කපා නිම කරන ලද කොටස මිනිස් දින කීය ද?

(ii) ඇලේ ඉතිරි කොටස කපා නිම කිරීමට අවශ්‍ය මිනිස් දින ගණන කීය ද?

(iii) මෙම සේවක පිරිසට ඇලේ ඉතිරි කොටසින් $\frac{3}{5}$ ක් කපා නිම කිරීමට ගතවන දින ගණන සොයන්න.

(iv) දින 45 ක දී මුළු ඇලම කපා නිම කිරීමට නියමිතව තිබූ නමුත්, ඉතිරි කොටස කපා නිම කිරීමට පෙර සේවකයින් 4ක් අසනීප විය. ඇල කපා නිම කිරීමට අමතර දින කීයක් ගතවේ ද ?

(v) දිනකට සේවකයෙකුට රු. 3500 ක මුදලක් ගෙවයි නම් ඇල කපා නිම කිරීමට වැයවන මුදල කොපමණ ද?

* **

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved]

විශාඛා විද්‍යාලය කොළඹ - 5, විශාඛා විද්‍යාලය කොළඹ - 5, විශාඛා විද්‍යාලය කොළඹ - 5, විශාඛා විද්‍යාලය කොළඹ
Visakha Vidyalaya Colombo – 5, Visakha Vidyalaya Colombo – 5, Visakha Vidyalaya Colombo

විශාඛා විද්‍යාලය - කොළඹ 05
Visakha Vidyalaya, Colombo 05

දෙවන වාර පරීක්ෂණය 2023 (2023 ඔක්තෝම්බර්)
Second Term Test 2023 (October 2023)

ගණිතය II Mathematics II	10 ශ්‍රේණිය Grade 10	පැය තුනයි *Three hours*

- **A** කොටසෙන් ප්‍රශ්න පහක් ද, **B** කොටසෙන් ප්‍රශ්න පහක් ද තෝරාගෙන ප්‍රශ්න දහයකට පිළිතුරු සපයන්න.

A කොටස

* ප්‍රශ්න හයෙන් **පහකට පමණක්** පිළිතුරු සපයන්න.

1. $y = 5 - x^2$ ශ්‍රිතයේ ප්‍රස්තාරය ඇඳීම සඳහා පිළියෙල කරන ලද අසම්පූර්ණ වගුවක් පහත දී ඇත.

x	–3	–2	–1	0	1	2	3
y	–4	1	4	…..	4	1	–4

(i) $x = 0$ වන විට y හි අගය සොයන්න.

(ii) x අක්ෂය හා y අක්ෂ දිගේ කුඩා කොටු 10 කින් ඒකක එකක් නිරූපණය වන සේ ඉහත ශ්‍රිතයේ ප්‍රස්ථාරය අඳින්න.

ඔබේ ප්‍රස්තාරය ඇසුරින්,

(iii) ශ්‍රිතය ධන වන x හි අගය පරාසය ලියන්න.

(iv) $x^2 - 5 = 0$ සමීකරණයේ මූල සොයන්න.

(v) $\sqrt{3}$ හි අගය පළමු දශමස්ථානයට ලබාගන්න.

2. (*a*) ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් ආදායම් බදු ගණනය කරන ආකාරය පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

වාර්ෂික ආදායම	බදු ප්‍රතිශතය
පළමු රුපියල් 500 000	නිදහස්
දෙවන රුපියල් 500 000	4%
තෙවන රුපියල් 500 000	8%

මාලක විසින් වසරක දී ගෙවූ ආදායම් බදු මුදල රු. 44 000 ක් නම් ඉහත වගුව උපයෝගී කර ගෙන ඔහුගේ වාර්ෂික ආදායම සොයන්න.

(*b*) එක්තරා පළාත් පාලන ආයතනයක් වාර්ෂිකව වරිපනම් බදු අය කරනු ලබන්නේ 6% බැගිනි. රු. 80 000 ක් ලෙස වාර්ෂිකව තක්සේරු කර ඇති නිවසක් සඳහා කාර්තුවකට ගෙවිය යුතු වරිපනම් බදු මුදල කොපමණ ද?

(*c*) ආනයනය කරන ලද රෙදි සෝදන යන්ත්‍රයක් සඳහා වටිනාකමින් 25% ක තීරු බදු ප්‍රතිශතයක් අය කිරීමෙන් පසු එහි වටිනාකම රු. 200 000 ක් වූයේ නම් තීරු බදු අය කිරීමට පෙර රෙදි සෝදන යන්ත්‍රයේ වටිනාකම කොපමණ වී ද?

3. (i) x හි අගය සොයන්න.

$$\log_3 243 = x$$

(ii) සමීකරණය විසඳීමෙන් x හි අගය සොයන්න.

$$\log_2 3 + \log_2 x = \log_2 27 - \log_2 6 + 1$$

(iii) ලඝුගණක වගුව භාවිතයෙන් පමණක් අගය සොයන්න.

$$\frac{528.6 \times 8.4367}{39.86}$$

4. (*a*) (i) වාහන නැවතුම්පලක නවතා ඇති මෝටර් බයිසිකල් ගණන ත්‍රීරෝද රථ ගණනට වඩා 11 ක් වැඩිය. ඒවායේ ඇති මුළු රෝද ගණන 57 කි. නවතා ඇති ත්‍රීරෝද රථ ගණන x ලෙස ද මෝටර් බයිසිකල් ගණන y ලෙස ද ගෙන සමගාමී සමීකරණ යුගලක් ගොඩනගන්න.

(ii) ඉහත සමීකරණ විසඳීමෙන් මෝටර් බයිසිකල් හා ත්‍රිරෝද රථ ගණන වෙන වෙනම සොයන්න.

(*b*) විසඳන්න.

$$\frac{5}{(x-3)} - \frac{2}{3} = \frac{7}{(x-3)}$$

5. (i) ඍජුකෝණාස්‍රාකාර මල් පාත්තියක පළල මීටර x වන අතර එහි දිග පළල මෙන් දෙගුණයකට වඩා 1 m කින් වැඩිය. පාත්තියේ වර්ගඵලය 36 m^2 ක් නම් දී ඇති දත්ත ඇසුරින් වර්ගජ සමීකරණයක් ගොඩනගා එය විසඳීමෙන් මල් පාත්තියේ දිග සොයන්න.

(ii) සාධක සොයන්න.

$$9x^2 - \frac{y^2}{4}$$

(iii) සාධක දැනුම භාවිතයෙන් අගය සොයන්න.

$$23^2 + 23 - 12$$

6. ප්‍රාථමික පාසලක දින 30 ක් තුළ පරිභෝජනය කරන ලද ජල ඒකක පිළිබඳ තොරතුරු පහත අසමූහිත සංඛ්‍යාත ව්‍යාප්තියේ දැක්වේ.

දිනක දී වැය වූ ජල ඒකක (x)	25	26	27	28	29	30
දින ගණන (f)	2	10	4	6	5	3

(i) ජල පරිභෝජන ඒකකවල පරාසය කොපමණ ද?

(ii) පරිභෝජනය කරන ලද ජල ඒකක ගණනේ මාතය සොයන්න.

(iii) මෙම දත්ත ඇසුරින් x, f හා $f\,x$ තීර අඩංගු වගුවක් ගොඩනගන්න. එමගින් දිනක දී පරිභෝජනය කරන මධ්‍යන්‍යය ජල ඒකක ගණන ආසන්න පූර්ණ සංඛ්‍යාවට සොයන්න.

(iv) ජල සම්පාදන මණ්ඩලය මගින් ජල ඒකකයක් සඳහා රු. 175 ක් ද ස්ථාවර ජල බිල්පත් ගාස්තුව රු. 1200 ක් ද නම් පාසල විසින් මාසිකව ගෙවන ජල බිල්පතෙහි වටිනාකම සොයන්න.

[තුන්වැනි පිටුව බලන්න

B කොටස

* ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න.

7. සංඛ්‍යා රටාවක n වෙනි පදය $17 - 8n$ වේ.

(i) එහි මුල් පද තුන ලියන්න.

(ii) 21 වන පදය සොයන්න.

(iii) (-103) වන්නේ කී වෙනි පදය දැයි සොයන්න.

(iv) $(n+2)$ වන පදය සොයන්න.

8. (i) $AB = 6$ cm ද, $B\hat{A}C = 45^\circ$ ද, $A\hat{B}C = 60^\circ$ ද වන ABC ත්‍රිකෝණය නිර්මාණය කරන්න.

(ii) C හි සිට AB ට ලම්භකයක් නිර්මාණය කර එය AB හමුවන ලක්ෂ්‍යය O ලෙස නම් කරන්න.

(iii) $A\hat{C}O$ මැන අගය ලියන්න.

(iv) $A\hat{O}C$ සමච්ඡේදකය නිර්මාණය කර එය AC හමුවන ලක්ෂ්‍ය P ලෙස නම් කරන්න.

(v) AOP කුමන වර්ගයේ ත්‍රිකෝණයක් දැයි හේතු සහිතව ලියන්න.

9. (a) "ත්‍රිකෝණයක පාද දෙකක් සමාන වේ නම් සමාන පාදවලට සම්මුඛ කෝණ සමාන වේ." ප්‍රමේයය විධිමත්ව රූප සටහනක් ඇඳ සාධනය කරන්න.

(b) රූපයේ $AB // DC$ ද, $DE = EC$ ද වන අතර AB පාදයේ මධ්‍ය ලක්ෂ්‍ය E වේ. $ADE\Delta \equiv BCE\Delta$ බව සාධනය කරන්න.



10. $ABCD$ සමාන්තරාස්‍රයේ AD පාදයේ මධ්‍ය ලක්ෂ්‍යය F වේ. දික් කළ CF හා දික් කළ BA, E හිදී හමුවේ. DE යා කර ඇත.

(i) ඉහත රූපය පිටපත් කර දී ඇති දත්තයන් ලකුණු කරන්න.

(ii) $ACDE$ සමාන්තරාස්‍රයක් බව සාධනය කරන්න.

(iii) එහි DE පාදය P තෙක් දික් කර ඇති අතර $A\hat{E}P$ සමච්ඡේදකය වන EG, AD ට සමාන්තර වේ. $ACDE$ රොම්බසයක් බව සාධනය කරන්න.



11. (*a*) දිග 1 m ද, පළල $\frac{1}{4}$ m ද, උස 10 cm ද වන ඝනකාභ හැඩැති ලී කුට්ටියක පරිමාව,

(i) ඝන සෙන්ටිමීටර්වලින් සොයන්න.

(ii) එම ඝනකාභ ලී කුට්ටිය යොදා ගනිමින් සාදාගත හැකි පැත්තක දිග 5 cm බැගින් වූ ඝනක ගණන සොයන්න.

(*b*) පරිමාව 0.4 m^3 වන ඝනකාභ හැඩැති ඝන ලෝහ කුට්ටියක පතුලේ වර්ගඵලය 8000 cm^2 වේ. එහි උස සොයන්න.

12. එක්තරා රැස්වීමකට සහභාගී වූ 265 දෙනෙකුගෙන් 134 ක් රතු තොප්පි පැලඳ සිටි අතර එම රැස්වීමට සහභාගි වූ කාන්තාවන් ගණන 140 කි. රතු තොප්පි පැලඳ සිටි පිරිමින් ගණන 77 කි.

(i) මෙම තොරතුරු වෙන් රූපයක දක්වන්න.

(ii) රතු තොප්පි පැලඳ සිටි කාන්තාවන් ගණන සොයන්න.

(iii) ඉහත පිරිමි අයගෙන් එක් අයෙකු අහඹු ලෙස තෝරාගත් විට ඔහු රතු තොප්පි පැලඳ නොසිටි පිරිමි අයෙකු වීමේ සම්භාවිතාව සොයන්න.

(iv) රතු තොප්පි පැලඳි අය R ද කාන්තාවන් W ද වේ නම් රතු තොප්පි පැලඳ සිටි පිරිමින් දැක්වෙන ප්‍රදේශය කුලක අංකනයෙන් දක්වන්න.

* **

PARCEL NO
LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්
PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න